# ලේඛනයේ ආරම්භය හා විකාසනය: කෙටි හැඳින්වීමක්

නීල් පුෂ්පකුමාර

The human language is an a unique feature of man. Initially language was meant to be purely of the spoken form. It is accepted that the art of writing originated as a result of the gradual evolution of the spoken language. Eminent scholars have pointed out various stages of evolution. According to Gelb (1952) there are three stages of the development of writing. i. No writing, (during which time pictures were used to communicat) ii. Forerunners of writing: Semasiography. This stage is classified into two as: Descriptive – Representation device and identifying – Mnemonic device. iii. Full writing: Phonography. This stage consisted of three gradual steps: Word – syllabic, Syllabic and Alphabetic. In addition, writing systems changed based on the developments of the spoken language which occured through time. As such, this article tries to briefly identify the origin and the evolution of the art of writing based on Gelb's classification.

**Keywords** : language, human language, the art of writing, initialization and evolution

මානව සංස්කෘතියේ අසහාය නිර්මාණයක් වශයෙන් 'භාෂාව' හැඳින්විය හැකි ය. එය මානවයා අන්‍ය සත්ත්වයින්ගෙන් සුවිශේෂී තත්ත්වයට පත් කරන්නකි. 'භාෂාව' කෙදින කෙසේ ඇති වී ද? යන්න පිළිබඳ ව ශිෂ්ටාශිෂ්ට සමාජීය මානවයාගේ විචාරාක්ෂිය ඉතා ඈත අතීතයේ සිට යොමු වූ බවට සාධක පවතී. එසේ ම 'භාෂාව' යන්නෙන් අදහස් කෙරෙනුයේ කුමක් ද? යන්න ද විවිධ

---

© **කථිකාචාර්ය නීල් පුෂ්පකුමාර**

සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අංජලී වික්‍රමසිංහ

**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 21 කලාපය, 2014/2015** මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

විද්වත්හු විවිධ නයින් නිර්වචනය කළහ. එසේ වුව ද, මේ දක්වා ඉදිරිපත් වී ඇති භාෂා නිර්වචන අතරින් ජෝර්ජ් එල්. ටේගර් (George L. Trager) සහ බර්නාඩ් බ්ලොක් (Bernard Block) 1942, 1949, 1962 යන වර්ෂයන්හි දැක්වූ නිර්වචන ඇසුරින් සැකසුණු[1] නිර්වචනය සම්භාවිත සේ පිළිගැනේ. ''භාෂාවක් නම් මිනිසුන් - සමාජීය සමූහයක සාමාජිකයන් ද, සංස්කෘතියක කොටස්කරුවන් ද වශයෙන් අන්‍යෝන්‍ය ක්‍රියාකාරිතා හා සන්නිවේදනය සඳහා යොදා ගන්නා සම්මුතික වූ වාග් සංකේත පද්ධතියක්''[2] බව ඔවුන්ගේ නිර්වචනලින් කියැවෙයි.

දෙවනුව, ලේඛනය යන්නෙන් අදහස් කරනුයේ කුමක් දැයි විමසා බැලීම වැදගත් වෙයි. ''ලේඛන යන්නෙන් අදහස් කෙරෙන්නේ ලෝක සම්මත දෘශ්‍යමාන සලකුණු අනුසාරයෙන් අන්තර්මානව සන්නිවේදනය සිදු කරන ක්‍රමවේදයක්''[3] වශයෙන් අර්ථ දක්වා ඇත.

ලේඛන කලාවට භාෂාවේ හිමි වන ස්ථානය කුමක් ද? යන්න අනතුරුව විමර්ශනය කළ යුතු ය. ඒ අනුව එය භාෂාවේ ක්‍රමානුකූල පරිණාමයෙන් ඇති වූවක් බව වටහා ගත හැකි ය. භාෂාව යන්නෙන් මූලිකව අදහස් කෙරෙනුයේ භාෂණයයි. කථා ව්‍යවහාරයයි. ''... ලිවීම භාෂාව වශයෙන් සැලකිය නොහැකි ය. එය භාෂාවේ පිටපතකි. නැතහොත් භාෂාව සටහන් කර තබන ක්‍රමයකි.''[4] තවත් මතයකට අනුව පැහැදිලි වන්නේ කථන වචන වනාහි මානසික අත්දැකීම්හි සංකේත බවත්, ලිඛිත වචන වනාහි කථනයෙහි සංකේත''[5] බවත් ය. ඒ අනුව, ලොව සෑම භාෂාවක ම පළමුව කථන භාෂාව ඇති වූ බවත්, එහි ක්‍රමානුකූල පරිණාමයෙහි ප්‍රතිඵලයක් වශයෙන් ලේඛනය ඇති වූ බවත් නිගමනය කළ හැකි ය. ''මනුෂ්‍ය භාෂාවේ ඉතිහාසය අනුව බැලුවහොත් මුලින් ආයේ කථන මාධ්‍යය බවත්, ලේඛන මාධ්‍යය පසුව ආවක් බවත් පෙන්වයි. මීට විශේෂයෙන් ම හේතු වන්නේ මනුෂ්‍ය භාෂාවේ දී කථා මාධ්‍යය මුලින් පහළ වීමත්, ලේඛන මාධ්‍යය පසු කලෙක දී කථන මාධ්‍යයේ ඇති ශ්‍රව්‍යමය සංකේත ලිඛිත සංකේත මගින් නිරූපණය කිරීම සඳහා තනාගත් දෙවන මාධ්‍යයක් වීමත් ය''[6] යනුවෙන් කේ. එන්. ඕ. ධර්මදාස කරන සඳහන එයට සාක්ෂ්‍ය සපයයි.

අනතුරුව ලේඛන කලාවේ ඉතිහාසය විමසීම වැදගත් ය. 'ලිවීම පටන් ගෙන ඇත්තේ මිනිසා තම සිතුම් හා හැඟුම් දෘශ්‍යමාන සංඥා අනුසාරයෙන් තමාට සහ අනෙක් සියලු ජනයාට අවබෝධ කර ගත හැකි සේ එක් විශේෂිත ක්‍රමවේදයකට ඇතුළත් කළ දින සිට ය'[7]. භාෂාවේ ඉතිහාසය හා එයට සාපේක්ෂව ලේඛනයෙහි ඉතිහාසය විමර්ශනය කරන විමල් ජී. බලගල්ලයෝ මෙසේ පවසති. ''... මේ විස්තරයෙන් පෙනී යා යුතු වැදගත් සත්‍යයක් නම්, භාෂාව ලොව පහළ වී ඉතා දීර්ඝ කාලයක් ගත වනතුරු, කථාව හෙවත් භාෂණය මිස ලේඛනයක් නොපැවති බව ය. එක් මානව විද්‍යාඥයකු උපහැරණයක් මඟින් පැහැදිලි කරන්නේ 'මිනිසා භාෂණය ආරම්භ කොට දවසක් (එනම් පැය විසිහතරක් හෙවත් මිනිත්තු 1140 ක්) ගත වී ඇත්තේ නම් ලේඛනය ආරම්භ කොට ගත වී ඇත්තේ මිනිත්තු පහක් පමණි.' යනුවෙනි''[8] මෙසේ ලේඛනයේ ඉතිහාසය භාෂා ඉතිහාසයට සාපේක්ෂව ඉතා මෑත අතීතයකට හිමිකම් කියන බව සනාථ කළ හැකි ය. තව ද, වර්තමානයෙහි පවා අප්‍රිකානු ගෝත්‍රික ජනයා, ලක්දිව ආදිවාසී ජනයා හා ඇමරිකාවේ රතු ඉන්දියානු ජනයා ලේඛන කලාවකට උරුමකම් නොකියති. මෙසේ ලේඛන කලාව නොහඳුනන භාෂා රාශියක් ලෝකයෙහි වේ. එසේ ම ලෝකයෙහි භාෂා රාශියක් ලේඛන කලාවක් සහිත උසස් භාෂා බවට පත් වූයේ පසුගිය සියවස් කිහිපය ඇතුළත ය. වර්තමානයේ ලොව පවත්නා සමස්ත භාෂාවන් සලකා බලන කල ඒවා ඉතා මෑතක දී ලේඛනය හඳුනාගත් භාෂ, ලේඛනය පුරුදු වෙමින් පවතින භාෂා, ලේඛනය රහිත භාෂා වශයෙන් භාෂා ගවේෂකයෝ දක්වති.[9]


ලේඛන කලාව ආරම්භ වී ක්‍රමිකව විකාසනය වෙමින් වර්ධනය වූ ආකාරය විමසීමෙන් එය ක්‍රමික භාෂා පරිණාමයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ බව සනාථ කර ගත හැකි ය. ලේඛන කලාව පිළිබඳ පර්යේෂණයන් කළ වාග්වේ දීන් පෙන්වා දෙන ආකාරයට ලේඛනයේ පරිණාමීය අවධි තුනකි. ලෙහ්මන් වින්ෆර්ඩ් (Lehmann Winfred) දක්වන ආකාරයට වචනාක්ෂර (Logographic), වර්ණාක්ෂර (Syllabic), ව්‍යස්ත ශබ්දාක්ෂර (Alphabetic) යනුවෙන් ලේඛනයේ විකාසනීය අවධි තුනක් දැකිය හැකි ය.[10] තවත් වර්ගීකරණයකට අනුව ලේඛන ක්‍රමයේ (writing system) විකාසනය ප්‍රධාන ප්‍රවර්ග 04කට දැක්විය හැකි ය.

I. ලඝු සංකේත ලේඛන (Logographies)
II. සමස්ත ශබ්දාක්ෂර ලේඛන (Syllabaries)
III. ව්‍යවස්ථ ශබ්දාක්ෂර ලේඛන (Alphabets)
IV. ලාක්ෂණික ලේඛන (Featural scripts) යනුයි.[11]

අයි. ජේ. ගෙල්බ් (I.J. Gelb) ද ලේඛනයේ ක්‍රමික විකාසනීය අවධි තුනක් දක්වයි.

I. ලේඛනයක් නොමැති අවධිය (No writing)
II. ලේඛනයේ නිමිති අවධිය (Forerunners of writing)
III. සම්පූර්ණ ලේඛන කලාවක් සහිත අවධිය (Full writing)[12]

යනුවෙනි. මෙම කරුණු ගෙල්බ් විසින් දක්වන ලද පහත සටහන ඇසුරින් මනාව පැහැදිලි වේ.




(Geld I.J. A study of writing, p. 190)

අපගේ ප්‍රස්තුතයට අදාළ කරුණු සාකච්ඡා කිරීමේ පහසුව උදෙසා අයි. ජේ. ගෙල්බ් දැක්වූ පියවරයන් ආශ්‍රය කර ගැනෙයි. ඒ අනුව, ලේඛන කලාවේ මූලබීජ අවස්ථාව වන ලේඛන කලාවක් රහිත අවධිය වශයෙන් ප්‍රාග් ඓතිහාසික මානවයා පර්වත, ගුහා, ගස් ආදියෙහි ඇඳි චිත්‍ර දැක්විය හැකි ය. 'ලේඛන භාෂාවේ මුල් ම අවස්ථාව සේ ගැනෙන සංක්ෂිප්තව දක්වන ලද සත්ත්වරූප, ජ්‍යාමිතික ආකාර රූප විවිධ විෂයන්ට සම්බන්ධ අසම්පූර්ණ චිත්‍ර ඊශාන දිග ස්පාඤ්ඤය, නිරිතදිග ප්‍රංශය, නැගෙනහිර මධ්‍යධරණී ප්‍රදේශය, උතුරු යුරෝපය සහ උතුරු-අප්‍රිකාව වැනි රටවලින් සොයාගෙන ඇති අතර, මෙයින් ඇතැම් චිත්‍ර ක්‍රි. පූ. 20, 000 තරම් අතීතයකට හිමිකම් කියයි'.[13] මානව ශිෂ්ටාචාරය පිළිබඳ යුග අතුරින් පශ්චිම පුරාණ ශිලායුගයට (Upper palaelithic age) මෙම චිත්‍ර අයත් වේ. ලේඛන කලාවේ ක්‍රම විකාසනය විමසීමේ දී ආදි මානවයා චිත්‍ර මගින් අපේක්ෂා කළ අරමුණු විමසීම වැදගත් වේ. විමල් ජී. බලගල්ලේ එය පියවර හතරකින් දක්වයි. එනම්,

I. පියවර - ආභිචාරික (Magic) බල විශේෂයක් උදෙසා.
II. පියවර - කලාත්මක වින්දනයක් උදෙසා
III. පියවර - තමන්ට / අනුන්ට ස්වරතෝපක්‍රමයක් වශයෙන්
IV පියවර - සන්නිවේදනෝපක්‍රමයක් වශයෙන් යනුවෙනි. [14]

මෙහි පළමු හා දෙවන පියරයන්ට අයත් චිත්‍ර, ලේඛනයක් නොමැති අවධිය යටතට අයත් කළ හැකි ය. එම චිත්‍රවලින් යම් අදහසක් සිතුවම් කිරීම හෝ වින්දනමය පරමාර්ථය ඉක්මවා ගිය ලේඛන කලාවක් පරමාර්ථ කර ගත් බවක් නොපෙනේ. ටී. ජී. ටර්කර් (T.G. Tucker)[15] කරන සඳහනට අනුව මුල් ම අවධියේ ඒ ඒ වස්තූන් දැක්වීම විෂයෙහි ඊට ආවේණික රූ සටහන් (චිත්‍ර) අඳින ලද බව පැහැදිලි වේ.

මෙම චිත්‍ර, අදහස් සටහන්වලට නැඟීම වෙනුවට කතාව සටහන්වලට නැඟීමේ මූලික අදහස් පහළ වීමට පදනම් වී ඇත. Primitive systems of writing, ... Were originally based on pictorial representation pure and simple..."[16] යනුවෙන් මාරියෝ පේ (Mario Pei) කරන සඳහනින් පැහැදිලි වන්නේ ලේඛනයේ මූලබීජ අවස්ථාව මෙම සිතුවම් නියෝජනය

කරන බවයි. එනිසා යම් සිද්ධියක් විස්තර කරනු පිණිස හෝ හුදු විනෝදය සඳහා ඇඳි සිතුවම් ලේඛනයේ ආරම්භයට මූලබීජයක් මුවා විනා ලිවීමට අයත් නොවන බව විද්වත් මතයයි.[17]


ලේඛන කලාවේ දෙවන අවස්ථාව වශයෙන් චිත්‍ර ලේඛන නිමිති අවස්ථාව (Forerunner of writing) දැක්විය හැකි ය. මුල් කාලීන චිත්‍රවල කලාත්මක අගය විනා අක්ෂරමය අගයක් නොවීය. එසේ වුව ද, මෙම යුගය වන විට චිත්‍රයන්හි කලාත්මක අගය අබිබවා නැඟී සිටි අක්ෂරයමය අගයක් විද්‍යමාන වේ. ඒ අනුව මිනිසා කලාත්මක හා චිත්‍රමය අගයෙන් තොර වූ රූප සටහන් මාර්ගයෙන් අදහස් හුවමාරු කර ගැනීමේ අවස්ථාවක් මෙම අවධියේ දී දැකිය හැකි ය. එය අර්ථමය ලේඛනය (Semasiography) නොහොත් 'සංකල්පමය හෙවත් චින්තනමය ලේඛනය' (Idoegraphy) අවධිය වශයෙන් ද හැඳින්වේ. නිදසුනක් වශයෙන් 'මිනිසා ඇවිදියි' යන අදහස දීමට මිනිස් රූපයක් ඇඳිය හැකි වුවත්, එහි චිත්‍රමය අගය හැර අක්ෂරමය අගයක් ඇති නො වේ. එහෙත් 'මිනිසා' යන්න හැඟවීමට මිනිස් රුවක් සහ 'ඇවිදියි' යනාර්ථය ජනනයට පා මාරු කරන විලාසය දක්වන රූප සටහනක්  සිතුවම් කිරීමෙන් අදහස් පැවසීම සඳහා නොව වචනාර්ථ ජනනය සඳහා එය උපස්ථම්භක වන බව පැහැදිලි වේ.[18] එසේ ම මුල් අවධියේ චිත්‍රලිපි දෘශ්‍යමාන ජීව-අජීවී රූපවලට සීමා වූ අතර ඒවා භාෂණයේ එන සෑම වචනයක් ම පැවසීමට ද ප්‍රමාණවත් නොවී ය. ගුණ, ක්‍රියා, සංඥා වැනි ද්‍රව්‍ය නාම සටහන් කිරීමට මගක් නොවූයෙන් ඒ සඳහා අමුතු ක්‍රමයක චිත්‍ර ඇඳීමට සිදු වූ බව පෙනෙයි. එහෙයින් දුක, සැප, කෑම, බීම ආදිය හඟවන වචන හැඟවීම පිණිස සම්මත රූප සටහන් ක්‍රමයක් භාවිත කළ බව පෙනෙයි. ඒ සඳහා චීන භාෂාවේ එන නිදසුන් කිහිපයක් ද තුළනාත්මක වාග් විද්‍යාව කෘතියෙහි දැක්වේ. [19]





මෙහි පළමු සටහනෙන් 'හොඳ' යන වචනය සටහන් කර ඇත්තේ, ස්ත්‍රියකගේ හා දරුවකුගේ රූ සටහන් එකට ඇඳීමෙනි. 'බැබලීම' යන වචනය හැඟවීමට ඉර-හඳ ද යොදා ඇති අයුරු

දෙවන රූපයෙන් පෙනෙයි. මෙසේ චිත්‍රයත්, අදහසත් අතර ඇති සම්බන්ධතාව අඩු වී, වචනයත්-චිත්‍රයත් අතර වන සම්බන්ධතාව වැඩි වන විට චිත්‍රය, වචනය වෙනුවට යොදන සංකේතයක් බවට පත් වෙයි.[20] එම සංකේතමය චිත්‍ර, චිත්‍රාක්ෂර (picture writing) නමින් හැඳින් වේ.[21] මුල් ම චිත්‍රාක්ෂර හමුවන්නේ මෙසපොතේමියානු ශිෂ්ටාචාරයෙනි. තව ද යනාකාරයෙන් සුමේරියන් භාෂාවේ එන පා සලකුණක් වශයෙන් වාග් විද්‍යාඥයින් හඳුන්වන සටහනින් දඩයමාශ්‍රිත යමක් පවසන්නට ඇති බව පිළිගැනේ.

තව ද, නයිල් ගංගා නිම්නයේ ජීවත් වූ ඊජිප්සියන්වරුන් හා චීනුන් විසින් භාවිත චිත්‍රාක්ෂර ද හමු වී ඇත.



චීනයෙන් හමු වී ඇති ඉහත සංකේතයෙන් අශ්වයකු නිරූපිත බව පිළිගැනේ. මෙහි පසුකාලීන ව්‍යාප්තියත් සමඟ පහත පරිදි වේ.




මෙය නූතන චීනයේ අශ්වයා හැඳින්වීමට යොදන සංකේතයට ද අතිශය සමාන බව වාග්විද්‍යාඥයින්ගේ අදහසයි. මෙම සාධක අනුව පැහැදිලි වන්නේ ක්‍රි. පූ. 6000 පමණ වන විට නව ශිලා යුගය පසු කොට ලෝහ යුගයට පිවිස සිටි සුමේරියන්වරුන්, ක්‍රි. පූ. 5000 පමණ වන විට සන්නිවේදනය සඳහා චිත්‍රාක්ෂරය යොදා ගැනීමේ තත්ත්වය දක්වා දියුණු වී සිටි බවයි.

ලේඛන කලාවේ මුල් අවස්ථාවක් වන චිත්‍රාක්ෂර ක්‍රමය පසු කාලීන විකාසනයත් සමඟ වෙනස් වන අයුරු ඊජිප්සියන්වරුන් ගල්වල කෙටූ හා පැපිරස් පොතුවල ලියූ චිත්‍රාක්ෂරවලින් පැහැදිලි වේ. පසුකාලීන සුමේරියන්වරුන් බැබිලියෝනියන් හා ඇසිරියන්වරුන් භාවිත කළ කීලාක්ෂර (Cuneiform sign) මෙහි වර්ධනීය අවස්ථාවකි.[22] මෙම කීලාක්ෂර ඇති වීමත් සමඟ

චිත්‍රාක්ෂරවල පැවති චිත්‍රමය ස්වරූපය මුළුමනින් ම ඉවත් වී අක්ෂරමය ස්වරූපයට පත් වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් චිත්‍රයන්හි ස්වභාවිකත්වය පහව ගොස් වචන හඳුන්වන සංකේත පමණක් ඉතිරි වන අයුරු යනුවෙන් ලේනාඩ් බ්ලූම්ෆීල්ඩ් (Leonard Bloomfield) දක්වන සඳහනින්[23] පැහැදිලි වේ. මේ කරුණු අයි. ජී. ගෙල්බ් සුමේරියන්වරුන් භාවිත කළ බීලාක්ෂර පිළිබඳ දක්වන පහත සටහනින් පැහැදිලි වේ. [24]

WORD-SYLLABIC SYSTEMS




PICTORIAL ORIGIN OF TEN CUNEIFORM SIGNS

ලේඛන කලාවේ තෙවන අවස්ථාව වශයෙන් සම්පූර්ණ ලේඛන (full-writing) අවස්ථාව දැක්විය හැකි ය. [25] සැබෑ ලේඛනය ආරම්භ වනුයේ අනුරූපතාවෙන් වඩ වඩාත් ඈත් වූ නිශ්චිත සටහන්වලින් භාෂාවේ වචනයක් නියෝජනය කෙරෙතැයි සාමාජිකයන් අතර සම්මුතියක් ඇති වීමත් සමඟ ය. මෙය ශබ්දාශ්‍රිත ලේඛනයක් (phonography) බවට පත් වනුයේ ක්‍රමානුකූල වර්ධනයත් සමඟ ය. එය පියවර කිහිපයකින් දක්වා ඇත. 'වචනාක්ෂර ලේඛනයෙන් ශබ්දාක්ෂර (වර්ණාක්ෂර) ද, ශබ්දාක්ෂරයන්ගෙන් අක්ෂරයක ස්වර - ව්‍යංජන වෙන් කිරීමේ ක්‍රමය (ව්‍යස්ත ශබ්දාක්ෂර ලේඛනය) ද ඇති වූ බව පෙනෙයි. [26] මෙසේ ලේඛන කලාවේ ක්‍රමික විකාසනයත් සමඟ වචනාක්ෂර ලිපි (logoraphy) තත්ත්වයට පිවිසි ලිපි හතක්

ගැන සඳහන් වන බවත්, ඒවායින් මෙතෙක් විශ්වසනීය අයුරින් කියවා නොමැති ලිපි විශේෂ තුනත්, හිටයිට් ලිපියත් හැර අනෙක් ලිපි විශේෂ තුන ම අනුක්‍රමයෙන් ශබ්දාක්ෂර ක්‍රමය (sylabic) හෝ ව්‍යස්ත ශබ්දාක්ෂර (Alphabetic) වූ හෝ වර්ණලිපියක් දෙසට විකාසනය වූ බව ද, එසේ නැතහොත් එවැන්නකට මුල් වූ බව හෝ දැකිය හැකි බව විමල් ජී. බලගල්ලගේ අදහසයි. [27]

ශබ්දාශ්‍රිත ලේඛනයේ දෙවන පියවර වන්නේ ශබ්දාක්ෂර (sylabic) ක්‍රමයයි. මෙය වර්ණ ලිපි ලෙස ද දැක් වේ. වචනාක්ෂර වෙනුවට වර්ණාක්ෂර ලිවීම කෙරෙහි මිනිසාගේ අවධානය යොමු වූයේ එක් වචනයක් හැඳින්වීම සඳහා අඳින ලද චිත්‍රයක් ශබ්දයෙන් එම වචනයට සමාන වූවත්, අදහසින් වෙනස් වචන හැඳින්වීම සඳහා ද යෙදීමට පටන් ගැනීමෙන් පසුව බව විද්වතුන්ගේ අදහසයි. එසේ වචනාක්ෂර ස්වරූපය හැර දමා වර්ණ ලිපි බවට පත් වූ ලිපි සියල්ල ගණ හතරකට බෙදිය හැකි බවත්, ඒවා නම් සුමේරියානු, මිසර හා චීන ලිපි විශේෂ තුනත්, මෙතෙක් නිවැරදිව කියවා නොමැති ඊජියානු ලිපියත් ය.[28] වචනාක්ෂර වර්ණාක්ෂර බවට පත් වීමත් සමග ඇති වූ වැදගත් ප්‍රතිඵලයක් නම් වචනාක්ෂර ලිපිවල වූ දහස් ගණනක් පටන් සිය ගණනක් වූ අක්ෂර පහසුවෙන් පරිහරණය කළ හැකි ආකාරයට සැකසීමයි. සෙමිටික් වර්ණ මාලා බොහෝමයක වර්ණ සංකේත 22 ක් වීම, මිසර ලිපියේ වර්ණ 22 ක් වීම ආදිය මෙයට නිදසුන් සේ දැක්විය හැකි ය.

තව ද, මෙසමයේ තථ්‍ය ලේඛනය ක්‍රමයෙන් වර්ධනය වන ආකාරය අක්ෂරවල සිට අක්ෂර වින්‍යාසය දක්වා ගමන් කිරීමෙන් පැහැදිලි කර ගත හැකි ය.


*Katakana*

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ア | カ | サ | タ | ナ | ハ | マ | ヤ | ラ | ワ | ガ | ザ | ダ | バ | パ |
| a | ka | sa | ta | na | ha | ma | ya | ra | wa | ga | za | da | ba | pa |
| イ | キ | シ | チ | ニ | ヒ | ミ | | リ | ヰ | ギ | ジ | ヂ | ビ | ピ |
| i | ki | si | ti(tsi) | ni | hi | mi | | ri | wi(i) | gi | zi | di | bi | pi |
| ウ | ク | ス | ツ | ヌ | フ | ム | ユ | ル | | グ | ズ | ヅ | ブ | プ |
| u | ku | su | tu(tsu) | nu | hu | mu | yu | ru | | gu | zu | du | bu | pu |
| エ | ケ | セ | テ | ネ | ヘ | メ | エ | レ | ヱ | ゲ | ゼ | デ | ベ | ペ |
| e | ke | se | te | ne | he | me | ye | re | we (e) | ge | ze | de | be | pe |
| オ | コ | ソ | ト | ノ | ホ | モ | ヨ | ロ | ヲ | ゴ | ゾ | ド | ボ | ポ |
| o | ko | so | to | no | ho | mo | yo | ro | wo | go | zo | do | bo | po |
| ン (n) | | | | | | | | | | | | | | |

ඉහත දැක්වූ කතකන (kathakana) නම් ජපන් භාෂාවේ එන රූපවලින් පැහැදිලි වන්නේ අක්ෂරවල සිට අක්ෂර වින්‍යාසය දක්වා ලේඛනය ඉදිරි පියවරක් තබා ඇති බවයි.

ශබ්දාශ්‍රිත ලේඛනයේ උපරිම අවස්ථාව වශයෙන් දැක්විය හැක්කේ ව්‍යස්ත ශබ්දාක්ෂර ලේඛනය (Alphabetic System) හෙවත් ස්වර-ව්‍යංජන වෙන් කොට ලිවීමේ (Alphabetic) ක්‍රමයයි. එය අපරදිග විද්වතුහු බොහෝ දෙනෙක් මෙම ලේඛන ක්‍රමයේ උපරිම අවස්ථාව මෙන් ම විශිෂ්ටතම අවස්ථාව සේ සලකති. මුල් ම අක්ෂර මාලාව බිහිකිරීමේ ගෞරවය හිමිවන්නේ ග්‍රීකයන්ට බව ගෙල්බ් සඳහන් කරයි. මෙසපොතේමියාවේ සුමේරියන්වරුනට තමන් භාවිත කළ අක්ෂර, අක්ෂර මාලාවක් දක්වා වර්ධනය කිරීමට අවශ්‍ය විය. ඒ අනුව තමනට ශක්තිය හා ජීවය ලබා දෙන්නා වූ දෙවියා වූ එන්ලිල් (Enlil) සම්බන්යෙන් ඔවුන් තුළ ඇති වූ හැඟීම් ප්‍රකාශනය ඇසුරෙන් සැකසුණු අක්ෂර කලාව ''Enlil-ti'' නම් වේ. මෙසේ මුලින් ම ග්‍රීසියේ අක්ෂර මාලාව ඇති වීමෙන් පසු වෙනත් රටවල ද අක්ෂර මාලා ඇති විය. ඒ අතර පර්සියාවේ ක්‍යුනීෆෝම් (cuneiform) භාෂාවත්, ලතින් භාෂාවත් ප්‍රධාන වේ. මෙම භාෂා දෙක සංසන්දනාත්මකව අධ්‍යයනය කළ ඓතිහාසික වාග්වේදීහු එය අක්ෂර වින්‍යාසයේ සිට අක්ෂර මාලාව දක්වා විකාසනය වීමක් බව පවසති. ගෙල්බ් විසින් දක්වන ලද ක්‍යුනිෆෝම් ලේඛනවල එන අක්ෂර කිහිපයක් මීට නිදසුන් වශයෙන් පහත දැක් වේ. [29]

THE ALPHABET




OLD PERSIAN SYLLABARY

මේ සියල්ලෙන් පැහැදිලි වන්නේ පර්සියන් ලේඛන අක්‍ෂරවල සිට අක්‍ෂරමාලාව දක්වා සංක්‍රමණික අවධියක් වන බව ගෙල්බ් සඳහන් කරයි.[30]

ලේඛනය යනු භාෂාවේ ක්‍රමානුකූල පරිණාමයේ ප්‍රතිඵලයකි. එය වර්තමානයෙහි පවා වෙනස් වන භාෂණයට අනුව වෙනස් වේ. ඉංග්‍රීසි භාෂාවේ එන ZOO යන වචනය සිංහල අක්‍ෂර මාලාවට අනුව නිවැරදිව ලිවිය නොහැකි ය. එයට අක්‍ෂරයක් අවශ්‍ය ය. එසේ ම භාෂණයත් සමඟ ඇති වූ 'ෆ' ශබ්දය සිංහල වර්ණමාලාවට එකතු වූයේ ද මෙම පරිණාමීය ස්වභාවය ලේඛන කලාව කෙරෙහි බලපාන හෙයිනි.

ඉහත සියලු කරුණු සලකා බලන කල පැහැදිලි වන කරුණු කිහිපයකි. ලෝකයේ පළමුව භාෂාව යන්නෙන් කතා ව්‍යවහාරය ම අදහස් කළ බවත්, එහි පරිණාමයත් සමඟ ලේඛනය ආරම්භ වූ බවත් පළමු කරුණයි. තව ද, ලේඛන කලාව, ලේඛනයක් රහිත චිත්‍ර ලිපි අවධිය, ලේඛන නිමිති සහිත අවධිය හෙවත් චිත්‍රාක්‍ෂර අවධිය හා සම්පූර්ණ ලේඛනයක් සහිත අවධිය හෙවත් ශබ්දාශ්‍රිත ලේඛන අවධිය ආදි අවධීන් කිහිපයක් අනුව ක්‍රමාණුකූලව සිදු වූ විකාසනයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූවක් බව දෙවන කරුණයි. එසේ ම එය අතීතයේ, වර්තමානයේ මෙන් ම අනාගතයේ ද කථන භාෂාවට අනුරූපව වෙනස් වන්නක් බව ද පැහැදිලි ය.

**ආන්තික සටහන්ඃ**

1 බලගල්ලේ, විමල් ජී. , භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය, ඇස්. ගොඩාගේ සහ සමාගම, කොළඹ, 1995, 11 පිටුව.

2 "Language is a system of arbitrary vocal system of arbitrary vocal symbols, by means of which human being as members of a social group and participants in a culture, Interact and communicate"

3 "Writing is clearly a system of human intercommunication by means of conventional visible marks…" Gelb, I.J, A Study of writing, Routledge and kegan paul Ltd. London, 1952, P. 12

4 ජයසේකර, ආනන්ද, ජයසේකර, චිත්‍රා තුලනාත්මක වාග්විද්‍යාව, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2000, 124 පිටුව.

5 " Spoken words are the symbols of mental experience and written words are the symbols of spoken words" Gelb. I.J. A Study of writing, Routledge and kegan paul Ltd, London, 1952, P. 13

**3rd Proof**




6 ධර්මදාස කේ. එන්. ඕ. ලේඛනය හා භාෂණය හෙවත් භාෂා ද්විරූපතාව, සංස්කෘතික ග්‍රන්ථ මාලා, 09, ස. ක. දෙ, 1999, 01 පිටුව.

7 " Writing began at the time when man learned how to communicate his thoughts and feelings by means of visible signs, understandable not only to himself but also to all other persons more or less initiated into the particular system….." Gelb. I.J. A Study of writing, Routledge and kegan paul Ltd, London, 1952, P. 11

8 බලගල්ලේ, විමල්. ජී, භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය, එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 1995, 110 පිටුව.

9 ජයසේකර, ආනන්ද, ජයසේකර, චිත්‍රා, තුළනාත්මක වාග් විද්‍යාව, එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 2000, 124 පිටුව.

10 Winfred P. Lehmann, Historical Linguistið, Routledge, London, 1995, P. 57.

11 www. wikipedia.org

12 Gelb I.J. A study of writing, Routledge and kegan paul. Ltd. London, 1952, P. 190

13 " The earliest embryo –writings - schematic figures of animals, geometric patterns, crude pictures of objects of various kinds-have been found in north –eastern Spain, south – western France, the eastern Mediterranean, northern Europe and North Africa some of these go back to about 20,000 B.C" Diringer, David, Writing, Thames and Hudson, London, 1962, P. 27

14 බලගල්ලේ විමල් ජී. භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1945, 112 පිටුව.

15 " In the earliest stage of such writing each sing is a clear picture. The sing for ‘Sun' is a sun. The sing for a mountain is an elevation rising to a peak or peaks….. in Chinese, for example, a mountain come to be represented first adequately enough by the sing " Tucker, T.G. Introduction to the Natural History of Language, Blackie and son Ltd, London, 1908, Pp. 47-48

16 Pei Mario, The story of language, George Allen and unwin Ltd, London, 1952, P. 87

17 ජයසේකර, ආනන්ද, ජයසේකර, චිත්‍රා, තුළනාත්මක වාග් විද්‍යාව, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2000, 126 පිටුව.

18 The Cambridge Encyclopedia of Language, ed, crystal, David, Cambridge University Press, 1987, P. 198

19 ජයසේකර, ආනන්ද, ජයසේකර, චිත්‍රා, තුළනාත්මක වාග් විද්‍යාව, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2000, 128 පිටුව.

20 Yule, George, The study of Language, Cambridge University press, London. 1985, P. 10

21 ජයසේකර, ආනන්ද, ජයසේකර, චිත්‍රා, තුළනාත්මක වාග් විද්‍යාව, එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2000, 127-128 පිටු.

22 The earliest cuneiform was a development pictographic symbols. Subsequently, the cript was used to write words and syllables, and to mark phonetic elements." The Cambridge Encyclopedia of Language, ed, crystal, David, Cambridge University Press, 1987, P.198

23 Purely pictorial charactors that are noted associated with speech-forms sink into subsidiary use. The linguistic value predominates more and more, specially as the characters become conventionalized in shape, l£ing There resemblance to picture object the character become symbols that is marks or groups of marks that conventionally represent some linguistic form" Bloomfield, Leonard, Language, Henry Holt and company, New York, 1933, P. 285.

24 ජයසේකර, ආනන්ද, ජයසේකර, චිත්‍රා, තුළනාත්මක වාග් විද්‍යාව, එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2000, 127 පිටුව.

25 Gelb, D.J, A Study of writing, Routledge and kegan paul Ltd, London, 1952, P. 70

26 " ….From the point of view the theory of writing the evolution is from a word syllabic writing through a syllabic writing to an alphabetic writing" -Ibid-, P.191

27 බලගල්ලේ විමල් ජී. භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1945, 119 පිටුව.

28 බලගල්ලේ විමල් ජී. භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1945, 120 පිටුව.

29 Gelb, D.J, A Study of writing, Routledge and kegan paul Ltd, London, 1952, P. 174.

30 " All these features indicate that the Persian writing was in the transition stage from a syllabic to an alphabetic system" Gelb, D.J, A Study of writing, Routledge and kegan paul Ltd, London, 1952, P. 174.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලියඃ**

ජයසේකර, ආනන්ද, ජයසේකර, චිත්‍රා, තුළනාත්මක වාග්විද්‍යාව, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2000 දෙ. මු.

ධර්මදාස, කේ. එන්. ඕ, භාෂාව හා සමාජය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1972 ප්‍ර. මු.

ධර්මදාස, කේ. එන්. ඕ, ලේඛනය හා භාෂණය හෙවත් භාෂා ද්විරූපතාව, සංස්කෘතිය ග්‍රන්ථමාලා 9, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, 1999 ප්‍ර. මු.

බලගල්ලේ, විමල්, ජී, භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1995 ප්‍ර. මු.

Bloomfield, Leonard, Language, Henry Holt and company, New York, 1933, F.p
Diringer David, writing, Thames and Hudson, London, 1962 F.P.
Gelb D,J. A Study of writing, Routledge and kegan paul Ltd, London, 1952 F.P.
Pei, Mario, The story of language, George Allen and unwin Ltd, London, 1952 F.P.
Revesz, G, The origin and prehistory of Language, (Trunlated by, J. Butler) Longmans,
Green and Co. London, 1956 F.P.
Sturtevant Edger. H, An Introduction ti linguistic science, yale University press, London,1947 F.P.
Tucker, T.G, Introduction to the Natural History of Language, Blackie and son Ltd, London,1908 F.P.
Winfred P. Lehmann, Historical Linguistið, Routledge, London, 1995,F.P..
Yule, George, The study of Language, Cambridge University press, London. 1985 F.P.

**ශබ්දකෝෂල විශ්වකෝෂ හා වෙබ් අඩවි:**

Routledge Dictionary of Language and Linguistið, Ed: by: Trauth, Gregory and Kazzazi, Kerstin, Routledge and kegan paul Ltd, London.
The Cambridge Encyclopedia of Language, ed, crystal, David, Cambridge University Press,1987. F.P.
The New Encyclopedia Britannica,William Benton, Publisher, 1948.
www.trueorigin.org
www.answerseingenesis.org